# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1816 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 08/12/2024
පැය 0610

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට - පදවිය පොලිස් ස්ථානය.**

2024.12.05 වන දින රාත්‍රී කාලයේ පදවිය පොලිස් වසමේ බෝගහවැව ප්‍රදේශයේ නිවසක සිටි වයස අවුරුදු 73 ක කාන්තාවකට යතුරු පැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් පදවිය පොලිස් ස්ථානය මගින් විමර්ශන ආරම්භ කර ලදි.

ඒ අනුව පුල්මුඩේ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් 2024.12.06 වන දින වැලිඔය පොලිස් වසමේ දී **ටී 56 ගිනි අවියක් හා රිවෝල්වර වර්ගයේ ගිනි අවියක් සන්තකයේ තබාගෙ සිටි වයස අවුරුදු 42 ක් වන කිරිඉබ්බන්වැව ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු** අත් අඩංගුවට ගෙන වැලිඔය පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසු වැඩිදුර විමර්ශන සඳහා රැඳවුම් නියෝග ලබාගෙන තිබුණි.

එම සැකකරු සම්බන්ධයෙන් පදවිය පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් සිදු කල වැඩිදුර විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු මත මෙම අපරාධය සිදු කිරීමට පැමිණි බවට සැක කරන වෙඩික්කරු හා පැදිකරු අපරාධ සඳහා පැමිණි යතුරු පැදිය සමඟ අත් අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 26, 30 ක් වූ මහියංගනය හා ඇහැටුගස්වැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

තවද, රැඳවුම් නියෝග මත විමර්ශන සිදු කරන සැකකරු සන්තකයේ තිබූ ටී 56 ගිනි අවිය මෙම අපරාධය සඳහා යොදාගෙන ඇති බවට අනාවරණය වී ඇත. පදවිය පොලිසිය වැඩි දුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් සිදුකර මුදල් කොල්ලකෑ සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට - නුවරඑළිය පොලිසිය.**

2024.12.06 වන දින අළුයම් කාලයේදී නුවරඑළිය පොලිස් වසමේ ශ්‍රී ලංගම ඩිපෝවේ රාජකාරි යෙදි සිටි වයස අවුරුදු 85 ක් වු ගැල්වේගම්මානය, නුවරඑළිය ප්‍රදේශයේ පදිංචි ආරක්ෂක නිලධාරියකු තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර රුපියල් ලක්ෂ 1,052,167/- ක මුදලක් කොල්ලකෑමේ සිද්ධිය සම්බන්ධයෙන් නුවරඑළිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශනයක් සිදු කර සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණි.

අත් අඩංගුවට ගත් **සැකකරුවන් අවුරුදු 34, 41 සහ 55 යන වයස් වල පසුවන බදුල්ල, රේනදපොල, මහව යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වන අතර දෙනෙකු එම ආයතනයේ මුදල් අයකැමි වරයෙකු සහ රියදුරෙකු වේ.**

**සැකකරුවන් 2024.12.07 වන දින නුවරඑළිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිමේන් අනතුරුව 2024.12.19 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. නුවරඑළිය** පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. ත්‍රිරෝද රථ රියදුන්ගේ රන් භාණ්ඩ හා මුදල් කොල්ලකෑ සැකකරුවන් සිව් දෙනෙකු අත් අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ දිසාව අපරාධ කොට්ඨාසය.**

නුගේගොඩ කොට්ඨාසයේ පොලිස් ස්ථාන වලට වාර්ථා වී තිබු කුලී ගමන් යන මුවාවෙන් ත්‍රිරෝද රථවලට නැගී ගමන් කරමින් සිටියදී රියදුරන් හට මත්වීමට යමක් ලබා දී මත් කරවා ඔවුන් සහන්තකයේ තිබූ රන් භාණ්ඩ හා දේපල කොල්ලකෑ සිද්ධින් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් දකුණු අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශනයක් සිදු කර 2024.12.07 වන දින සැකකරුවන් සිව් දෙනෙකු කොටුව පොලිස් වසමේ මල්වත්ත ප්‍රදේශයේදී අත් අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 43, 45, 48 සහ 49 යන වයස් වල පසුවන ගාල්ල, බදුල්ල, වැරැල්ලගම, මරදාන යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

**සැකකරුවන් ගෙන් සිදු කල ප්‍රශ්න කිරිමේ දී ඔවුන් විසින් මහරගම,අතුරුගිරිය, කහන්කේ, වැලිගම, නාවලපිටිය, කටුගස්තොට, වත්තේගම, නානුඔය හා කහවත්ත යන පොලිස් වසම් වල ත්‍රිරෝද රථ රියදුරන්ගෙන් ඉහත ආකාරයට රන් භාණ්ඩ හා දේපල කොල්ලකා ඇති බවට අනාවර්ණය වී ඇත. සැකරුවන් විසින් කොල්ලකන ලද රන් භාණ්ඩ වලින් කොටසක් උණුකර තිබිය දී නිලධාරින් විසින් සොයාගෙන ඇත.** බස්නාහිර පළාත් දකුණු දිසාව අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. සැකකටයුතු මරණයක් - පින්දෙනිය පොලිස් වසම.**

2024.12.07 වන දින උදෑසන කාලයේදී පින්දෙනිය පොලිස් වසමේ කැගල්ල අවිස්සාවේල්ල මාර්ගයේ අරන්දර කැඳ වංගුව අසල කාණුවක මුනින් අතට වැටී පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් සිටින බවට පින්දෙනිය පොලිසියට ලද දුරකථන පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වු උඩුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණය සිදුවූ ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරික්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරික්ෂණය සඳහා කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පින්දෙනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. සැකකටයුතු මරණයක් - වරකාපොල පොලිස් වසම.

2024.12.07 වන දින සවස් කාලයේදී වරකාපොල පොලිස් වසමේ තුල්හිරිය ප්‍රදේශයේ නිවසක් තුල පුද්ගලයෙකු මියගොස් සිටින බවට වරකාපොල පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ තුල්හිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**හදිසි** මරණ පරික්ෂණය සිදු කිරීමේ මෘත ශරීරයෙන් ලේ වාහනය වී තිබීම හේතුවෙන් මරණය සම්බන්ධයෙන් ඇති වූ සැකය මත **හදිසි** මරණ පරික්ෂකවරයා විසින් මේ සම්බන්ධව මහේස්ත්‍රාත් පරික්ෂණයක් පැවැත්විය යුතු බවට පොලිසියට දන්වා ඇත. මෘත ශරීරය එම ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇති අතර වරකාපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ජා ඇල පොලිස් ස්ථානය.

2024.12.07 වන දින දහවල් කාලයේ ජා ඇල පොලිස් වසමේ කුෂ්වත්ත ප්‍රදේශයේදී ජා ඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 506 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කුෂ්වත්ත, කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජා ඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.12.07 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ඕඩියන් ප්‍රදේශයේ දී හා පිලියන්දල පොලිස් වසමේ බෝකුන්දර ප්‍රදේශයේ දී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු හා **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස සහ පිලියන්දල පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 හා 23 වයස්වල පසුවන වන පිලියන්දල සහ දෙහිවල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස හා පිලියන්දල පොලිස් ස්ථාන මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2024.12.07 වන දින දහවල් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ හබරකඩ හන්දිය අසලදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.

2024.12.07 වන දින උදෑසන කාලයේ කටුනායක පොලිස් වසමේ මාදු ගඟ රම්‍ය තොටුපොල ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා මිලි ලීටර් 3,591,000 (බැරල් 19) ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 61 ක් වන හීනටියන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. නීති විරෝධී ලෙස මෙරටට සිගරට් රැගෙන එන ලද සැකකාරියක් අත්අඩංගුවට- පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය.

2024.12.07 වන දින දහවල් කාලයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව ඩුබායි රාජ්‍යයේ සිට මෙරටට රැගෙන එන ලද සිගරට් 23600 (කාටුන් 118) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 55 ක් වන ගලගෙදර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. දියේ ගිලී මියයාමක් - කතරගම පොලිස් වසම.

2024.12.07 වන දින සවස් කාලයේ කතරගම පොලිස් වසමේ සෙල්ලකතරගම අක්කර 20 වැවේ ඔරුවක් පෙරලී පුද්ගලයෙකු දියේ ගිලී මිය ගොස් ඇති බවට කතරගම පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වන සෙල්ලකතරගම ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

**මරණකරු මිතුරන් තිදෙනෙකු සමඟ ඔරු පදිමින් සිටිය දී ඔරුව පෙරලීමෙන් මෙම අනතුර සිදුව ඇති අතර අනෙක් මිතුරන් තිදෙනා පීනා දිවි බේරාගෙන ඇත.** මෘත ශරීරය කතරගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**12. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - හතරලියද්ද පොලිස් වසම.**

2024.12.07 වන දින සවස් කාලයේ හතරලියද්ද පොලිස් වසමේ දේදුණුපිටිය ප්‍රදේශයේ දී විදුලි සැර වැදීමෙන් පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට හතරලියද්ද පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වන දේදුණුපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

**මරණකරු රැකියාව වශයෙන් සත්ව ගොවිපොලක් පවත්වාගෙන යන අතර එහි පිරිසිදු කටයුතු සිදු කරන අතර තුර විදුලි සැර වැදී ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇත.** මෘත ශරීරය රඹුක්කන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හතරලියද්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ජයපුරම් පොලිස් ස්ථානය.**

2024.12.07 වන දින සවස් කාලයේ ජයපුරම් පොලිස් වසමේ වීරපණ්ඩියමුනේ ප්‍රදේශයේදී ජයපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන ජයපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජයපුරම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. වන අලියෙකු පහරදී පුද්ගලයෙකු මියයාමක් - නාවුල පොලිස් වසම.**

2024.12.07 වන දින අළුයම් කාලයේ නාවුල පොලිස් වසමේ බෝගස්බොබැල්ල ප්‍රදේශයේ දී වන අලියෙකු පහර දී පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට නාවුල පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ** බෝගස්බොබැල්ල **ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

**මරණකරු ඉහත ප්‍රදේශයේ ඥාති නිවසකට ගොස් නැවත නිවසට පැමිණෙමින් සිටිය දී මෙම වන අලි ප්‍රහාරයකට ලක්ව ඇති අතර** නාවුල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**15. මාරක රිය අනතුරක් - පොලොන්නරුව පොලිස් වසම.**

2024.12.07 වන දින රාත්‍රී කාලයේ පොලොන්නරුව පොලිස් වසමේ පොලොන්නරුව සෝමාවතී මාර්ගයේ කි.මී.03 කණුව අසලදී පොලොන්නරුව දෙස සිට සෝමාවතී දෙසට ධාවනය කල යතුරු පැදියක් මාර්ගය හරහා ගමන් ගත් පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික පුද්ගලයා පොලොන්නරුව රෝහලට ඇතුළත් කිරීමෙන් පුසු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ පොලොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොලොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් යතුරු පැදිකාරිය ද තුවාල ලබා පොලොන්නරුව රෝහලේ ප්‍රතිකාර ලබන අතර පොලොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**